# රජයේ දැන්වීමයි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

## සෞන්දර්ය විෂය ප්‍රායෝගික පරීක්ෂණ

උක්ත විභාගයෙහි ප්‍රායෝගික පරීක්ෂණ 2022-09-20 දින සිට 2022-09-28 දින තෙක් අපේක්ෂකයන් 106288 ක් සඳහා දිවයින පුරා පරීක්ෂණ මණ්ඩල 1406 කදී පැවැත්වේ.

41 - සංගීතය (අපරදිග) විෂයෙහි ශ්‍රවණ පරීක්ෂණය 2022-09-25 දින එම විෂයෙහි ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වෙන මධ්‍යස්ථානවලදී පැවැත්වේ.

1. 40 සංගීතය (පෙරදිග)
2. 41 සංගීතය (අපරදිග)
3. 42 සංගීතය (කර්ණාටක)
4. 44 නැටුම් (දේශීය)
5. 45 නැටුම් (භරත)
6. 50 නාට්‍ය හා රංග කලාව (සිංහල)
7. 51 නාට්‍ය හා රංග කලාව (දෙමළ)
8. 52 නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

02. ඉහත සඳහන් විෂයන්හි අවසාන ප්‍රතිඵල නිර්ණය කිරීම සඳහා ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය යන කොටස් දෙකෙහිම ලකුණු උපයෝගී කර ගන්නා බැවින් එම කොටස් දෙකටම පෙනී සිටීම අනිවාර්ය වේ. ඒ සඳහා පෙනී නොසිටින අපේක්ෂකයන් සඳහා එම විෂයේ ප්‍රතිඵල ලබාදීම සිදු කරනු නොලැබේ.

03. පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් අදාළ විදුහල්පතිවරුන් වෙත ද පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ඔවුන් තම අයදුම්පතේ සඳහන් කර ඇති ලිපිනයට ද තැපැල් කර යවා ඇත.

04. පාසල් ප්‍රධානීන් වෙත හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත ලැබී ඇති ප්‍රවේශ පත්‍රයේ මය සංශෝධන, මාධ්‍ය සංශෝධන හෝ වෙනත් සංශෝධනයක් වේ නම් වහාම විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව වෙත ඉදිරිපත් කර ඒවා සංශෝධනය කරවා ගත යුතුය.

05. ප්‍රවේශ පත්‍ර නොලැබුණු විදුහල්පතිවරුන් තම පාසල් අංකය, පාසලේ නම, ලිපිනය හා අදාළ තොරතුරු ද, පෞද්ගලික අයදුම්කරුවන් නම සහ ලිපිනය, විභාග අංකය, සෞන්දර්ය විෂයය ආදී තොරතුරු ද පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව වෙත පහත සඳහන් දුරකථන ඔස්සේ දැන්විය යුතු බවත්, විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු බවත් මෙයින් දන්වා සිටිනු ලැබේ. තවද, විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.doenets.lk වෙත පිවිස විභාග අංකය ඇතුළත් කිරීම මගින් ප්‍රවේශ පත්‍රය බාගත කරගත හැකිය.

> අයදුම්කරුවකු වෙනුවෙන් වෙනත් අයකු විභාගයට පෙනී සිටීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.

**විමසීම් :**

**දුරකථන අංක 0112784208, 0112784537, 0112786616**

**ෆැක්ස් අංකය 0112784422**

**එල්.එම්.ඩී. ධර්මසේන**
**විභාග කොමසාරිස් ජනරාල්**

**මගේ අංකය : 6/8/OL/PRC/2021**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

2022-09-16